**උපාධි ප්‍රදානෝත්සව දිනයන්හි විශ්වවිද්‍යාල පරිශ්‍රයේ වෙළඳ කුටි / ජංගම වෙළඳ කුටි පවත්වාගෙන යාම.**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 24 වන උපාධි ප්‍රදානෝත්සවය 2024.09.11 සහ 12 දෙදින උපාධි ප්‍රදානෝත්සව ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම දින වලදී විශ්වවිද්‍යාල සේවක සුභසාධක සංගම්වලට, ශිෂ්‍ය සමිති / සමාගම් වලට සහ විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථයින්ගේ සංගම්වලට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල තාවකාලික සහා ජංගම වෙළඳකුටි පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දීමට තීරණය කර ඇත.

**කොන්දේසි ඃ**

01. විශ්වවිද්‍යාල සේවක සුභසාධක සංගමවලට ශිෂ්‍ය සමිති / සමාගම්වලට සහ විශ්වවිද්‍යාල ආදි විද්‍යාර්ථයන්ගේ සංගම්වලට පමණක් වෙළඳ කුටි පවත්වාගෙන යාම සඳහා අවසර දෙනු ලැබේ. **<u>බාහිර පාර්ශව සඳහා අවසර දෙනු නොලැබේ.</u>**

02. එක් සංගමයකට එක් වෙළඳ කුටියක් සඳහා පමනක් අවසර දෙනු ලැබේ.

03. ශිෂ්‍ය සමිති / සමාගම් වලින් කරනු ලබන ඉල්ලීම් අදාල ශිෂ්‍ය සමිතියේ / සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික හරහා ඉදිරිපත් කළ යුතුය.

04. මෙම අයදුම්පත් උපාධි ප්‍රදානෝත්සව සංවිධායක කමිටුව වෙත යොමු කිරීමෙන් පසු පමනක් අවසර දෙනු ලැබේ.

05. වෙළඳ කුටි සඳහා ලබා දෙන ස්ථානය, ඉඩකඩ ප්‍රමානය විශ්වවිද්‍යාලය මගින් තීරණය කරන අතර අයදුම්කරුවන්ට ඒවා වෙනස් කල නොහැක.

06. වෙළඳ කුටි සඳහා වෙන් කරන ස්ථානයේ විශ්වවිද්‍යාල භූමියට /ගස්වැල් වලට හානි නොවන ආකාරයෙන් තාවකාලික වෙළඳ කුටියක් (canopy) ඔබ විසින් ඉදිකර ගත යුතුය. (ටකරන් මඩු ආදිය ඉදි කළ නොහැකිය)

07. වෙළඳකුටියේ අලෙවි කිරිමට බලාපොරොත්තුවන වන වෙළඳ භාණ්ඩ පිළබඳ විස්තරයක් සහ මිල ගණන් සහිත ලේඛනයන් අයදුම් පත්‍රය සමග භාර දිය යුතුය. ( එම මිල ගණන වෙළඳපොල මිල ගණන් ඉක්මවා නොයා යුතුය)

08. උපාධි ප්‍රදානෝත්සව ශාලාවලට ප්‍රවේශ වන මාර්ගය අවහිර වන ලෙස වෙළඳ කුටි ඉදි කිරීම තහනම් වන අතර එලෙස බාධාවන පරිදි ඉදිකරනු ලබන කුටි ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

09. වෙළඳ කුටි සඳහා රු.5,000.00 ක මුදලක් අයකරනු ලැබේ.

10. වෙළඳාම් කිරීමෙන් අනතුරුව වෙළඳ කුටිය අවට පිරිසිදු කළ යුතු අතර අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කළ යුතුය.

11. අහාර වර්ග / බීම වර්ග අලෙවි කුටියක් නම් සෞඛ්‍ය මාර්ගෝපදේශ නිසි පරිදි අනුගමනය කළ යුතු අතර මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ මත එසේ නොකරන කුටි ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

12. මුදල් ගෙවන ලද රිසිට්පත් (බිම් කුලිය) අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

ඉහත කොන්දේසිවලට යටත්ව උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනයන්හිදි වෙළඳ කුටියක් පවත්වාගෙන යාම සඳහා අයදුම් කිරීමට කැමති නම් 2024 අගෝස්තු 30 දිනට පෙර අදාල රිසිට්පත් සමග අයදුම් පත ලේඛකාධිකාරි කාර්යලය වෙත යොමු කළ යුතුය.

සීමිත වෙළඳ කුටි ප්‍රමානයක් සඳහා පමනක් අවසර ලබාදෙන බැවින් හැකි ඉක්මනින් ඔබගේ අයදුම් පත්‍රය ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිමි.

ප්‍රමාද වී යොමුකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**NOTICE**

The 24th Convocation Ceremony of the Rajarata University of Sri Lanka is scheduled to be held on 11th and 12th September 2024 at the University premises. Therefore, we are inviting interested parties or associations to set up **Business Stalls** for this Convocation Ceremony.

Applications can be obtained from the Registrar's Office on or before **30.08.2024**. ***A fee of Rs. 5000.00 will be charged from the Alumni Association members. (For the student associations and staff societies stalls are free of charge)***

Registrar

Rajarata University

15.08.2024